71343

OL/2021(2022)/61/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

61 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

| | | |
|---|---|---|
| භූගෝල විද්‍යාව | I, II | පැය තුනයි |
| புவியியல் | I, II | மூன்று மணித்தியாலம் |
| Geography | I, II | Three hours |

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

විභාග අංකය: ........................

## භූගෝල විද්‍යාව I

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

● අංක **1** සිට **5** දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **තිත් ඉර මත ලියන්න.**

**1.** ශ්‍රී ලංකාවට අයත් මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් .................. ක් පමණ වේ.
(64610 / 65610 / 66610)

**2.** පෘථිවි ව්‍යුහයට අනුව සියල්(Sial) ස්තරය අයත් වන්නේ ........................................ ට ය.
(කබොල / ප්‍රාවරණය / හරය)

**3.** උල්පතකින් ආරම්භ වන ගංගාවකට නිදසුනකි, ....................................... .
(නයිල් / තේම්ස් / රයින්)

**4.** ශ්‍රී ලංකාවේ මැදරට තේ වගාවට වැදගත් වන දිස්ත්‍රික්කයකි, ...................... .
(රත්නපුර / කෑගල්ල / බදුල්ල)

**5.** ශ්‍රමිකයන්ගෙන් බහුතරය විශේෂඥ දැනුම ඇති පුද්ගලයන්, පුහුණු කාර්මිකයන් හා පර්යේෂකයන් වීම ........................................ කර්මාන්තයේ විශේෂ ලක්ෂණයකි.
(මෝටර් රථ / යකඩ හා වානේ / විද්‍යුත්)

● අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් '**නි**' යන්න වටා ද, වැරදි නම් '**වැ**' යන්න වටා ද රවුමක් අඳින්න.

**6.** ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල කර්මාන්ත ගම්මාන පිහිටුවීම ගෘහ කර්මාන්ත සංවර්ධනය සඳහා ගත් ප්‍රතිඵලදායී පියවරකි. **නි / වැ**

**7.** පුත්තලම කලපුව ආශ්‍රිත ප්‍රදේශය ඉස්සන් වගාව සඳහා ප්‍රසිද්ධියක් උසුලයි. **නි / වැ**

**8.** ප්‍රති ශීර්ෂ දළ ජාතික නිෂ්පාදිතය සංවර්ධනය මැනීමේ නූතන මිනුමකි. **නි / වැ**

**9.** ගෝලීය උණුසුම් වීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධකය හරිතාගාර ආවරණයයි. **නි / වැ**

**10.** ලෝකයේ කපු පිළි කර්මාන්තය කපු වගාකරන රටවල පමණක් ස්ථානගත වීම විශේෂ ලක්ෂණයකි. **නි / වැ**

● අංක **11** සිට **19** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

**11.** වෙරළ මායිමේ සිට සාගරය දෙසට විහිදී ගිය නොගැඹුරු මුහුදු තීරය.......................... ලෙස හැඳින්වේ.

**12.** කෛන්ද්‍රීය ද්‍රව්‍ය බහුල ................................ පස බෝග වගාවට වඩාත් සුදුසු ය.

[දෙවැනි පිටුව බලන්න.

**13.** ශ්‍රී ලංකාවේ රබර් වගාව සම්බන්ධ උපදෙස් හා සේවා සපයන පර්යේෂණායතනය පිහිටුවා ඇති ස්ථානය වන්නේ ................................... ය.


**14.** හග්ගල, යාල හා ............................ ඇඩි ස්වාභාවික රක්ෂිත තුනකි.

**15.** ඓවම වශයෙන් වසර තිහකට අධික කාලයක් තුළ පවත්නා වායුගෝලීය සාමාන්‍ය තත්ත්වය ............................ ලෙස හැඳින්වේ.

- අංක **16** සිට **19** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන උපයෝගී කර ගන්න.

වර්ෂ 2009 සිට 2018 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ ගැඹුරු මුහුද, වෙරළාශ්‍රිත මුහුද හා මිරිදිය යන ධීවර අංශ තුන යටතේ නිෂ්පාදනය කරන ලද මත්ස්‍ය ප්‍රමාණයන් පහත ප්‍රස්තාරයෙන් දක්වා ඇත.

**ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදනය**
**2009 - 2018**




*මූලය : ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන - 2019, ශ්‍රී ලංකා මහ බැංකුව*

**16.** වෙරළාශ්‍රිත ධීවර කර්මාන්තය මගින් වැඩිම මත්ස්‍ය නිෂ්පාදනයක් සිදු කරන ලද්දේ .................. වර්ෂයේදී ය.

**17.** ගැඹුරු මුහුදු ධීවර කර්මාන්තය මගින් වැඩිම මත්ස්‍ය නිෂ්පාදනයක් සිදු වූයේ ........................ වර්ෂයේදී ය.

**18.** ධීවර අංශ තුනේම නිෂ්පාදනය එක්ව සලකා බැලූ විට වැඩිම මත්ස්‍ය නිෂ්පාදනයක් සිදු වූ වර්ෂය ............. ය.

**19.** ඉහත වසර දහය තුළ නොකඩවාම මත්ස්‍ය නිෂ්පාදනයේ වර්ධනයක් දැක්විය හැකි ධීවර අංශය කුමක් ද? ...............

- අංක **20** සිට **23** තෙක් දී ඇති ප්‍රශ්නවල **'අ'** සහ **'ආ'** යනුවෙන් තීරු දෙකක් දැක්වේ. **'අ'** තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙළට අනුව **'ආ'** තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි **අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**20.**

| 'අ'<br>**භෞතික ලක්ෂණය** | 'ආ'<br>**භෞතික ලක්ෂණයේ ස්වභාවය** |
|---|---|
| 1. රොකී | A - දූපත |
| 2. මැඩගස්කර් | B - කඳුවැටිය |
| 3. ටිටිකාකා | C - සානුව |
| | D - විල |

(1) A, B, C (2) B, A, D (3) B, C, D (4) C, B, D (......)

**21.**

| 'අ'<br>**කර්මාන්තය** | 'ආ'<br>**ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ** |
|---|---|
| 1. මිනිරන් | A - මීටියාගොඩ |
| 2. පිඟන් මැටි | B - රදාවඩුන්න |
| 3. වේවැල් භාණ්ඩ | C - බෝගල |
| | D - පුල්මුඩේ |

(1) A, C, B (2) B, C, A (3) C, A, B (4) D, B, C (......)

**22.**

| 'අ' ජල විදුලි බලාගාරය | 'ආ' සම්බන්ධ ගංගාව |
|---|---|
| 1. සමනල වැව | A - මහවැලි |
| 2. ලක්ෂපාන | B - වලවේ |
| 3. කොත්මලේ | C - කැලණි |
| | D - කළු |

(1) A, B, D (2) B, C, A (3) C, B, A (4) D, C, B (......)

**23.**

| 'අ' ආර්ථික කටයුතු | 'ආ' ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ |
|---|---|
| 1. කිරි නිෂ්පාදනය | A - වල්පිට |
| 2. සුළු අපනයන බෝග වගාව | B - අඹේවෙල |
| 3. කිවුල් දිය ධීවර කර්මාන්තය | C - මාතලේ |
| | D - හලාවත |

(1) A, B, C (2) B, C, D (3) C, D, B (4) D, A, B (......)

- අංක **24** සිට **37** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා එහි **අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**24.** තිරිඟු, ලෝක වෙළෙඳපොළේ ප්‍රධානම ධාන්‍ය වර්ගය වීමට බලපා ඇති හේතුව වන්නේ,
(1) වාණිජ මට්ටමින් වගා කෙරෙන ධාන්‍ය වර්ගයක් වීම ය.
(2) ලොව වැඩියෙන්ම නිෂ්පාදනය කෙරෙන ධාන්‍ය වර්ගයක් වීම ය.
(3) වෙනත් ධාන්‍ය වර්ගවලට වඩා අඩු මිලට ලබා ගත හැකි වීම ය.
(4) වෙනත් ධාන්‍ය වර්ගවලට වඩා තිරිඟුවලින් විවිධ ආහාර වර්ග සාදා ගැනීමට හැකි වීම ය. (......)

**25.** පෘථිවියේ මුළු වායු පරිමාවෙන් 50% ක් පමණ අන්තර්ගත වී ඇත්තේ,
(1) පරිවර්තී ගෝලයෙහි ය. (2) පරිවර්තී මණ්ඩලයෙහි ය.
(3) අපරිවර්තී ගෝලයෙහි ය. (4) අපරිවර්තී මණ්ඩලයෙහි ය. (......)

**26.** ලෝකයේ ස්වාභාවික රබර් නිෂ්පාදනයෙන් 95% ක්ම සපයනු ලබන්නේ,
(1) බ්‍රසීලයෙනි. (2) ඇමරිකා එක්සත් ජනපදයෙනි.
(3) බටහිර අප්‍රිකානු රටවලිනි. (4) දකුණු හා අග්නිදිග ආසියාතික රටවලිනි. (......)

**27.** යුරෝපයේ ව්‍යාපාරික කිරිපට්ටි පාලනය කෙරෙන රටවල් අතර ප්‍රමුඛත්වය ගන්නා රට වන්නේ,
(1) ප්‍රංශයයි. (2) බ්‍රිතාන්‍යයයි.
(3) ඩෙන්මාර්කයයි. (4) නෙදර්ලන්තයයි. (......)

**28.** ඉන්ධනමය ඛනිජයක් හා ලෝහමය ඛනිජයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ගල් අඟුරු- මැංගනීස් (2) පෙට්‍රෝලියම් - මිනිරන්
(3) පොස්පේට් - හුණුගල් (4) යපස් - වැලි (......)

**29.** සුළු අපනයන බෝග වර්ග වැඩිම ගණනක් වගා කරන දිස්ත්‍රික්ක යුගලය තෝරන්න.
(1) රත්නපුර, මාතලේ (2) මාතලේ, මහනුවර
(3) කෑගල්ල, මහනුවර (4) රත්නපුර, මහනුවර (......)

**30.** ශ්‍රී ලංකාවේ අපනයන ආදායමට වැඩිම දායකත්වයක් ලබාදෙන බෝග වර්ග දෙක දැක්වෙන වරණය තෝරන්න.
(1) තේ සහ රබර් (2) පොල් සහ තේ
(3) තේ සහ කුළුබඩු (4) රබර් සහ කුළුබඩු (......)

**31.** A - මීටර් 1400 ට වඩා උස් ප්‍රදේශවල ව්‍යාප්තව ඇත.
B - පතන වර්ගයේ ශාක බහුල ය.
C - ගස් ඇඹරුණු ස්වරූපයක් ගන්නා අතර කඳ සුළඟට ඔරොත්තු දේ.
D - මහරත්මල්, අරළු, බුළු, නෙල්ලි වැනි ශාක දක්නට ඇත.

ඉහත ලක්ෂණවලින් සමන්විත වනාන්තර වර්ගය වන්නේ,
(1) කඳුකර තෙත් කලාපීය වනාන්තර ය. (2) කඳුකර වියළි කලාපීය වනාන්තර ය.
(3) වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර ය. (4) අතරමැදි සදාහරිත වනාන්තර ය. (......)

[හතරවැනි පිටුව බලන්න.

**32.** කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක දෙක හැරුණු විට වැඩිම ජන සංඛ්‍යාවක් ඒකරාශි වී ඇති දිස්ත්‍රික්ක යුගලය තෝරන්න.
(1) කුරුණෑගල, මහනුවර (2) මාතලේ, මහනුවර
(3) රත්නපුර, ගාල්ල (4) කුරුණෑගල, කෑගල්ල (……)

**33.** පහත A සිට E දක්වා දී ඇති තොරතුරු අතුරෙන් අවසාදික පාෂාණ වර්ගවලින් ලබාගත හැකි ප්‍රයෝජන පමණක් ඇතුළත් වරණය තෝරන්න.
A - කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගැනීම
B - ආභරණ සෑදීම සඳහා යොදා ගැනීම
C - බලශක්ති මූලාශ්‍රයක් වශයෙන් යොදා ගැනීම
D - මහා මාර්ග ඉදිකිරීමේදී භාවිත කිරීම
E - බෑවුම් ප්‍රදේශ ආරක්ෂාවට යොදා ගැනීම
(1) A හා B (2) A හා C (3) B හා C (4) D හා E (……)

**34.** ලෝකයේ ප්‍රධාන මිනිරන් නිෂ්පාදකයා ලෙස සැලකෙන රට වන්නේ,
(1) මැඩගස්කරයයි. (2) ඉන්දියාවයි.
(3) ශ්‍රී ලංකාවයි. (4) ටැන්සානියාවයි. (……)

**35.** ලෝකයේ රටවල් සංවර්ධන මට්ටම අනුව කාණ්ඩ හතරක් යටතේ වර්ග කොට ඇත. මෙම වර්ග කිරීම සඳහා භාවිත කළ දර්ශකය වූයේ,
(1) භෞතික ජීවන තත්ත්ව දර්ශකයයි (PQLI). (2) මානුෂ දරිද්‍රතා දර්ශකයයි (HPI).
(3) මානුෂ පීඩක දර්ශකයයි (HSI). (4) මානුෂ සංවර්ධන දර්ශකයයි (HDI). (……)

**36.** ගෝලීය උෂ්ණත්වය වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස ධ්‍රැවීය අයිස් නිධි දිය වී මුහුදු මට්ටම ඉහළ යාම නිසා අනාගතයේදී වඩාත් තර්ජනයකට ලක් වේ යැයි සැලකෙන දූපත් සමූහය කුමක් ද?
(1) මාලදිවයින් (2) අන්දමන් (3) ලක්ෂද්වීප (4) හවායි (……)

**37.** CFC වායු විමෝචන ක්‍රියාකාරකම් අවම කිරීම හා වසර 2000න් පසු මුළුමනින්ම ඉවත් කිරීම සහ වාහනවලින් බැහැර කෙරෙන දුම් පිළිබඳ පරීක්ෂාව පිළිබඳ තීරණ ගනු ලැබූයේ,
(1) 1972 ස්ටොක්හෝම් සමුළුව මගිනි.
(2) 1982 වියානා සම්මුතිය මගිනි.
(3) 1984 මොන්ට්‍රියල් කෙටුම්පත මගිනි.
(4) 1992 රියෝද්ජැනීරෝහි පැවැත්වූ 'මිහිකත' සමුළුව මගිනි. (……)

- පහත A, B, C හා D වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක **38** සිට **40** තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. වියපත් ජන සංඛ්‍යාව
2. ශ්‍රම බලකාය

B - 1. කාර්මීකරණය
2. පාරිසරික විසංතුලනය

C - 1. පුනර්ජනීය බලශක්ති
2. පාරිසරික තුලිතතාව

D - 1. සම්පත් භාවිතය
2. තිරසර සංවර්ධනය

**38.** පළමුවැන්නේ වැඩිවීම දෙවැන්නට හේතුවක් වන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (……)

**39.** දෙවැන්නේ ස්ථාවරය කෙරෙහි පළමුවැන්න බලපාන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (……)

**40.** දෙවැන්නේ අඩුවීම කෙරෙහි පළමුවැන්නේ වැඩිවීම හේතුවන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (……)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**61 S I, II**

71343

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

| | |
|---|---|
| භූගෝල විද්‍යාව | I, II |
| புவியியல் | I, II |
| Geography | I, II |

## භූගෝල විද්‍යාව II

- ✻ මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
- ✻ I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.
- ✻ II කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.
- ✻ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි**.

### I කොටස

**1.** (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (පිටු අංක **8**) යොදා ගන්න.

අංක (i) සිට (v) දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) Ⓐ - Ⓑ රේඛාවෙන් දක්වා ඇත්තේ කුමක් ද?
(දළ බෑවුම / උත්තල බෑවුම / අවතල බෑවුම) (ලකුණු 01 යි)

(ii) Ⓒ අක්ෂරයෙන් දක්වා ඇති ලක්ෂණය කුමක් ද?
(වනාන්තර / ලඳු කැලෑ / තණබිම) (ලකුණු 01 යි)

(iii) Ⓓ- Ⓔ රේඛාවෙන් දක්වා ඇති ලක්ෂණය කුමක් ද?
(දිය බෙත්ම / කපොල්ල / ජල කපොල්ල) (ලකුණු 01 යි)

(iv) දී ඇති සිතියම් කොටසෙහි උසම ස්ථානය පිහිටා ඇති ප්‍රදේශය කුමක් ද?
(ඊසාන / ගිනිකොන / මධ්‍යම) (ලකුණු 01 යි)

(v) ප්‍රදේශයේ නිරිත කෙළවරේ සිට ඊසාන දෙසට විහිදෙන දුම්රිය මාර්ගය අයත් වන වර්ගය කුමක් ද?
(පටු / පුළුල් ඒකීය / පුළුල් ද්විත්ව) (ලකුණු 01 යි)

(vi) Ⓕ අක්ෂරයෙන් දක්වා කොටුකර ඇති ප්‍රදේශයේ ව්‍යාප්තව ඇති ව්‍යාපාරික වගාව කුමක් ද?
(ලකුණු 01 යි)

(vii) දුම්රිය මාර්ගයෙහි පිහිටා ඇති දුම්රියපොලවල් දෙක අතර දුර කිලෝමීටර් කීය ද? (ලකුණු 01 යි)

(viii) Ⓟ අක්ෂරයෙන් දැක්වෙන චතුරශ්‍රාකාර ප්‍රදේශයෙහි පිහිටි සංකේත මගින් දක්වා ඇති පොදු සේවා සපයන ආයතන **දෙකක්** (දුම්රියපොළ හැර) නම් කරන්න.
(ලකුණු 02 යි)

(ix) සිතියම් ප්‍රදේශය මස්සේ විහිදෙන දුම්රිය මාර්ගය, ඊට සමාන්තරව විහිදෙන ප්‍රධාන මාර්ගය හා පරිපාලන මායිම වැනි සංස්කෘතික ලක්ෂණවල විහිදීම තීරණය කිරීමෙහි ලා බලපා ඇති ප්‍රධාන භෞතික ලක්ෂණය කුමක් ද? (ලකුණු 01 යි)

[හයවැනි පිටුව බලන්න.

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව දක්වා ඇති තීරුව (පිටු අංක **9**) යොදා ගන්න.

අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබදව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.

(i) **අරාබි සානුව** - Ⓠ, Ⓡ, Ⓢ

(ii) **යුකටාන් අර්ධද්වීපය** - Ⓘ, Ⓙ, Ⓚ

(iii) **කොංගෝ ගංගාව** - Ⓤ, Ⓥ, Ⓦ

(iv) **බෙයිජිං නගරය** - Ⓐ, Ⓑ, Ⓒ

(v) **නවසීලන්තය** - Ⓛ, Ⓜ, Ⓝ

(ලකුණු 05 යි)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබදව දක්වා ඇති තීරුව (පිටු අංක **9**) යොදා ගන්න.

අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබදව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.

(i) **පේදුරුතුඩුව** - Ⓐ, Ⓑ, Ⓒ

(ii) **වෙරළ දඹයක්** පිහිටි ස්ථානය - Ⓞ, Ⓟ, Ⓠ

(iii) **කුමන** කුරුලු අභය භූමිය - Ⓤ, Ⓥ, Ⓦ

(iv) මිනිරන් ඛනිජය නිධිගතව ඇති **කහටගහ** සහ **කොළොන්ගහ** පතල් පිහිටි ස්ථානය - Ⓖ, Ⓗ, Ⓘ

(v) මෑතකදී ආරම්භ කරන ලද '**තම්බපවනි**' සුළං බලාගාරය පිහිටි දූපත - Ⓓ, Ⓔ, Ⓕ (ලකුණු 05 යි)

## II කොටස

**2.** (i) ජෛවගෝලයේ ක්‍රියාකාරිත්වයට බලපාන
(a) ජෛව සාධකයක් ද
(b) අජෛව සාධකයක් ද පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ජෛවගෝලයේ සීමාවන් **තුන** නිදසුන් මගින් දක්වන්න. (ලකුණු 03 යි)

(iii) මානුෂ ක්‍රියාකාරකම් හේතු කොටගෙන ජෛවගෝලයේ පැවැත්මට එල්ල වී ඇති තර්ජන **තුනක්** සඳහන් කර ඉන් **එකක්** පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 05 යි)


**3.** (i) ආසියාවෙන් බැහැර, වී වගා කරන පහත සඳහන් එක් එක් ගංගා නිම්නය පිහිටි රට කුමක්දැයි අනුපිළිවෙළින් ලියා දක්වන්න.
(a) පෝ ගංගා නිම්නය
(b) මරේ-ඩාර්ලිං ගංගා නිම්නය (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි වී වගාව වැදගත් වීමට බලපා ඇති හේතු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) ශ්‍රී ලංකාවේ වී වගාව සඳහා ඓන්ද්‍රීය පොහොර භාවිත කිරීමේ වාසි **දෙකක්** සඳහන් කරන්න.
(b) වී වගාව සඳහා ඓන්ද්‍රීය පොහොර භාවිත කිරීමේදී මතුවන ගැටලුවක් සඳහන් කොට එය විසඳා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයක් විස්තර කරන්න.

(ලකුණු 05 යි)

**4.** (i) යාබදව දක්වා ඇති ශ්‍රී ලංකාවේ සිතියම් කොටසෙහි Ⓐ අක්ෂරයෙන් දක්වා ඇති ධීවර වරායෙහි නම ද Ⓑ අක්ෂරයෙන් දක්වා ඇති මිරිදිය මසුන් බෝකරන මධ්‍යස්ථානයෙහි නම ද අනුපිළිවෙළින් ලියන්න. (ලකුණු 02 යි)




(ii) ධීවර කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි වැදගත් වීමට හේතු **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) (a) සාගර ජලය දූෂණය වන ආකාර **දෙකක්** සඳහන් කරන්න.

(b) සාගර ජලය දූෂණය වීම ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයට අහිතකර ලෙස බලපාන ආකාරය කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

**5.** (i) මෝටර් රථ කර්මාන්තය සඳහා වැදගත් වන ආසියාතික රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) මෝටර් රථ කර්මාන්තයේ නව ප්‍රවණතා **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය වර්තමානයේ මුහුණ පා ඇති ගැටලු **තුනක්** සඳහන් කර ඉන් එක් ගැටලුවක් නිරාකරණය කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

**6.** (i) ලෝකයේ ව්‍යාප්ත වී ඇති ප්‍රධාන වනාන්තර වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) වර්තමානයේ වනාන්තර හා වන ජීවීන් මුහුණ පා ඇති ගැටලු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ වනාන්තර සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** යෝජනා කර ඉන් එක් ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක කිරීම සඳහා ඔබට සහාය විය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**7.** (i) යාබදව දක්වා ඇති සිතියම් කොටසෙහි Ⓐ අක්ෂරයෙන් දක්වා ඇති ජනාධික කලාපයෙහි නම ද, Ⓑ අක්ෂරයෙන් දක්වා ඇති ජනහීන කලාපයෙහි නම ද අනුපිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)




(ii) ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල ශීඝ්‍ර ජන සංඛ්‍යා වර්ධනය නිසා වර්තමානයේ උද්ගත වී ඇති ගැටලු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව සම්බන්ධයෙන් මෑත කාලීනව දැකිය හැකි කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** සඳහන් කර, ඉන් එක් ලක්ෂණයක් තෝරා ගෙන එය ශ්‍රී ලංකාවේ සංවර්ධනය කෙරෙහි බලපාන ආකාරය විස්තර කරන්න. (ලකුණු 05 යි)

**8.** (i) පහත දක්වා ඇති එක් එක් උපද්‍රව වර්ගයට නිදසුනක් බැගින් සපයන්න.

(a) ජීව විද්‍යාත්මක උපද්‍රව

(b) භූ විද්‍යාත්මක උපද්‍රව (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ ජල ගැලීම්වලට නිරතුරුවම ගොදුරු වන ප්‍රධාන ගංගා නිම්න **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ ජල ගැලීම් ආපදාව අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කොට ඉන් **එක්** ක්‍රියාමාර්ගයක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

* * *

[අටවැනි පිටුව බලන්න.

71343

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/இலங்கை பரீட்சைத் திணைக்களம்/Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021 (2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021 (2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021 (2022)

විභාග අංකය / சுட்டெண் / Index Number ..............................

(61) භූගෝල විද්‍යාව II
புவியியல் II
**Geography II**

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි.
பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும்
For Examiner's Use Only

1. (අ) /(அ) /(a)

(i) ..............................................................................................

(ii) ..............................................................................................

(iii) ..............................................................................................

(iv) ..............................................................................................

(v) ..............................................................................................

(vi) ..............................................................................................

(vii) ..............................................................................................


(viii) ..............................................................................................

..............................................................................................

(ix) ..............................................................................................


10

(ආ) /(ஆ) /(b)




(i)
(ii)
(iii)
(iv)
(v)
5

(ඉ) /(இ) /(c)




(i)
(ii)
(iii)
(iv)
(v)
5

1. (අ) (அ) (a) $\frac{}{10}$ (ආ) (ஆ) (b) $\frac{}{5}$ (ඉ) (இ) (c) $\frac{}{5} = \frac{}{20}$

71343


සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

61 | II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

## භූගෝල විද්‍යාව II / புவியியல் II / Geography II




SCALE : 1 : 50,000

WWW.PastPapers.WIKI
Download past papers, notes, and more from Past Papers Wiki!

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**61 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

| | | |
|---|---|---|
| භූගෝල විද්‍යාව | I, II | පැය තුනයි |
| புவியியல் | I, II | மூன்று மணித்தியாலம் |
| Geography | I, II | Three hours |

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය: .......................

## භූගෝල විද්‍යාව I

**උපදෙස්:**

※ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
※ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

- අංක **1** සිට **5** දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **හිස් ඉර මත ලියන්න.**

**1.** ශ්‍රී ලංකාවට අයත් මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් ...65610..... ක් පමණ වේ.
(64610 / 65610 / 66610)

**2.** පෘථිවි ව්‍යුහයට අනුව සියල්(Sial) ස්තරය අයත් වන්නේ ....කබොල............... ට ය.
(කබොල / ප්‍රාවරණය / හරය)

**3.** උල්පතකින් ආරම්භ වන ගංගාවකට නිදසුනකි. .....තේම්ස්................

(නයිල් / තේම්ස් / රයින්)

**4.** ශ්‍රී ලංකාවේ මැදරට තේ වගාවට වැදගත් වන දිස්ත්‍රික්කයකි. ....බදුල්ල
(රත්නපුර / කෑගල්ල / බදුල්ල)

**5.** ශ්‍රමිකයන්ගෙන් බහුතරය විශේෂඥ දැනුම ඇති පුද්ගලයන්, පුහුණු කාර්මිකයන් හා පර්යේෂකයන් වීම ..........විදුලිය.............. කර්මාන්තයේ විශේෂ ලක්ෂණයකි.
(මෝටර් රථ / යකඩ හා වානේ / විදුලිය)

- අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් '**නි**' යන්න වටා ද, වැරදි නම් '**වැ**' යන්න වටා ද රවුමක් අඳින්න.

**6.** ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල කර්මාන්ත ගම්මාන පිහිටුවීම ගෘහ කර්මාන්ත සංවර්ධනය සඳහා ගත් ප්‍රතිඵලදායී පියවරකි. (නි) වැ

**7.** පුත්තලම කලපුව ආශ්‍රිත ප්‍රදේශය ඉස්සන් වගාව සඳහා ප්‍රසිද්ධියක් උසුලයි. (නි) වැ

**8.** ප්‍රති ශීර්ෂ දළ ජාතික නිෂ්පාදිතය සංවර්ධනය මැනීමේ නූතන මිනුමකි. නි (වැ)

**9.** ගෝලීය උණුසුම් වීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධකය හරිතාගාර ආවරණයයි. (නි) වැ

**10.** ලෝකයේ කපු පිළි කර්මාන්තය කපු වගාකරන රටවල පමණක් ස්ථානගත වීම විශේෂ ලක්ෂණයකි. නි (වැ)

- අංක **11** සිට **19** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

**11.** වෙරළ මායිමේ සිට සාගරය දෙසට විහිදී ගිය නොගැඹුරු මුහුදු සීරය මහාද්වීප තටාකය හැඳින්වේ.

**12.** ජෛන්ද්‍රිය ද්‍රව්‍ය බහුල .....ආසුබෙස්......... පස බෝග වගාවට වඩාත් සුදුසු ය.

/දෙවැනි පිටුව බලන්න.

13. ශ්‍රී ලංකාවේ රබර් වගාව සම්බන්ධ උපදෙස් හා සේවා සපයන පර්යේෂණායතනය පිහිටුවා ඇති ස්ථානය වන්නේ ......අගලවත්ත...... ය.


14. හග්ගල, යාල හා ......රිටිගල...... ඇඩි ස්වාභාවික රක්ෂිත තුනකි.

15. අවම වශයෙන් වසර තිහකට අධික කාලයක් තුළ පවත්නා වායුගෝලීය සාමාන්‍ය තත්ත්වය ......දේශගුණය...... ලෙස හැඳින්වේ.

- අංක **16** සිට **19** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන උපයෝගී කර ගන්න.

වර්ෂ 2009 සිට 2018 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ ගැඹුරු මුහුද, වෙරළාශ්‍රිත මුහුද හා මිරිදිය යන ධීවර අංශ තුන යටතේ නිෂ්පාදනය කරන ලද මත්ස්‍ය ප්‍රමාණයන් පහත ප්‍රස්තාරයෙන් දක්වා ඇත.

**ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදනය**
**2009 - 2018**




*මූලය : ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන - 2019, ශ්‍රී ලංකා මහ බැංකුව*

16. වෙරළාශ්‍රිත ධීවර කර්මාන්තය මගින් වැඩිම මත්ස්‍ය නිෂ්පාදනයක් සිදු කරන ලද්දේ ...2014... වර්ෂයේදී ය.

17. ගැඹුරු මුහුදු ධීවර කර්මාන්තය මගින් වැඩිම මත්ස්‍ය නිෂ්පාදනයක් සිදු වූයේ ......2018..... වර්ෂයේදී ය.

18. ධීවර අංශ තුනේම නිෂ්පාදනය එක්ව සලකා බැලූ විට වැඩිම මත්ස්‍ය නිෂ්පාදනයක් සිදු වූ වර්ෂය 2014... ය.

19. ඉහත වසර දහය තුළ නොකඩවාම මත්ස්‍ය නිෂ්පාදනයේ වර්ධනයක් දැක්විය හැකි ධීවර අංශය කුමක් ද? ගැඹුරු මුහුද

- අංක **20** සිට **23** තෙක් දී ඇති ප්‍රශ්නවල '**අ**' සහ '**ආ**' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. '**අ**' තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙලට අනුව '**ආ**' තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි **අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

20.

| 'අ' භෞතික ලක්ෂණය | 'ආ' භෞතික ලක්ෂණයේ ස්වභාවය |
|---|---|
| 1. රොකී | A - දූපත |
| 2. මැඩගස්කර් | B - කඳුවැටිය |
| 3. ටිටිකාකා | C - සානුව |
| | D - විල |

(1) A, B, C (2) B, A, D (3) B, C, D (4) C, B, D (..2..)

21.

| 'අ' කර්මාන්තය | 'ආ' ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ |
|---|---|
| 1. මිනිරන් | A - මීටියාගොඩ |
| 2. පිගන් මැටි | B - රදාවඩුන්න |
| 3. වේවැල් භාණ්ඩ | C - බෝගල |
| | D - පුල්මුඩේ |

(1) A, C, B (2) B, C, A (3) C, A, B (4) D, B, C සියල්ලන්ටම ලකුණු දෙන්න.

22.

| 'අ' ජල විදුලි බලාගාරය | 'ආ' සම්බන්ධ ගංගාව |
|---|---|
| 1. සමනල වැව | A - මහවැලි |
| 2. ලක්ෂපාන | B - වලවේ |
| 3. කොත්මලේ | C - කැලණි |
| | D - කළු |

(1) A, B, D  (2) B, C, A  (3) C, B, A  (4) D, C, B  (.2.)

23.

| 'අ' ආර්ථික කටයුතු | 'ආ' ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ |
|---|---|
| 1. කිරි නිෂ්පාදනය | A - වල්පිට |
| 2. සුළු අපනයන බෝග වගාව | B - අඹේවෙල |
| 3. කිවුල් දිය ධීවර කර්මාන්තය | C - මාතලේ |
| | D - හලාවත |

(1) A, B, C  (2) B, C, D  (3) C, D, B  (4) D, A, B  (.2.)

- අංක 24 සිට 37 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ඊට හිමි **අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

24. තිරිඟු, ලෝක වෙළෙඳපොළේ ප්‍රධානම ධාන්‍ය වර්ගය වීමට බලපා ඇති හේතුව වන්නේ,
(1) වාණිජ මට්ටමින් වගා කෙරෙන ධාන්‍ය වර්ගයක් වීම ය.
(2) ලොව වැඩියෙන්ම නිෂ්පාදනය කෙරෙන ධාන්‍ය වර්ගයක් වීම ය.
(3) වෙනත් ධාන්‍ය වර්ගවලට වඩා අඩු මිලට ලබා ගත හැකි වීම ය.
(4) වෙනත් ධාන්‍ය වර්ගවලට වඩා තිරිඟුවලින් විවිධ ආහාර වර්ග සාදා ගැනීමට හැකි වීම ය. (.2.)

25. පෘථිවියේ මුළු වායු පරිමාවෙන් 50% ක් පමණ අන්තර්ගත වී ඇත්තේ,
(1) පරිවර්ති ගෝලයෙහි ය.  (2) පරිවර්ති මණ්ඩලයෙහි ය.
(3) අපරිවර්ති ගෝලයෙහි ය.  (4) අපරිවර්ති මණ්ඩලයෙහි ය. (..1..)

26. ලෝකයේ ස්වාභාවික රබර් නිෂ්පාදනයෙන් 95% ක්ම සපයනු ලබන්නේ,
(1) බ්‍රසීලයෙනි.  (2) ඇමරිකා එක්සත් ජනපදයෙනි.
(3) බටහිර අප්‍රිකානු රටවලිනි.  (4) දකුණු හා අග්නිදිග ආසියාතික රටවලිනි. (.4.)

27. යුරෝපයේ ව්‍යාපාරික කිරිපට්ටි පාලනය කෙරෙන රටවල් අතර ප්‍රමුඛත්වය ගන්නා රට වන්නේ,
(1) ප්‍රංශයයි.  (2) බ්‍රිතාන්‍යයයි.
(3) ඩෙන්මාර්කයයි.  (4) නෙදර්ලන්තයයි. (.3.)

28. ඉන්ධනමය ඛනිජයක් හා ලෝහමය ඛනිජයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ගල් අඟුරු- මැංගනීස්  (2) පෙට්‍රෝලියම් - මිනිරන්
(3) පොස්පේට් - හුණුගල්  (4) යපස් - වැලි (..1...)

29. සුළු අපනයන බෝග වර්ග වැඩිම ගණනක් වගා කරන දිස්ත්‍රික්ක යුගලය තෝරන්න.
(1) රත්නපුර, මාතලේ  (2) මාතලේ, මහනුවර
(3) කෑගල්ල, මහනුවර  (4) රත්නපුර, මහනුවර (.2.)

30. ශ්‍රී ලංකාවේ අපනයන ආදායමට වැඩිම දායකත්වයක් ලබාදෙන බෝග වර්ග දෙක දැක්වෙන වරණය තෝරන්න.
(1) තේ සහ රබර්  (2) පොල් සහ තේ
(3) තේ සහ කුළුබඩු  (4) රබර් සහ කුළුබඩු (.3.)

31. A - මීටර් 1400 ට වඩා උස් ප්‍රදේශවල ව්‍යාප්තව ඇත.
B - පතන වර්ගයේ ශාක බහුල ය.
C - ගස් ඇඹරුණු ස්වරූපයක් ගන්නා අතර තද සුළඟට ඔරොත්තු දේ.
D - මහරත්මල්, අරළු, බුළු, නෙල්ලි වැනි ශාක දක්නට ඇත.

ඉහත ලක්ෂණවලින් සමන්විත වනාන්තර වර්ගය වන්නේ,
(1) කඳුකර තෙත් කලාපීය වනාන්තර ය.  (2) කඳුකර වියළි කලාපීය වනාන්තර ය.
(3) වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර ය.  (4) අතරමැදි සදාහරිත වනාන්තර ය. (.2.)

/හතරවැනි පිටුව බලන්න.

**32.** කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක දෙක හැරුණු විට වැඩිම ජන සංඛ්‍යාවක් ඒකරාශි වී ඇති දිස්ත්‍රික්ක යුගලය තෝරන්න.
(1) කුරුණෑගල, මහනුවර
(2) මාතලේ, මහනුවර
(3) රත්නපුර, ගාල්ල
(4) කුරුණෑගල, කෑගල්ල
(..1...)

**33.** පහත A සිට E දක්වා දී ඇති තොරතුරු අතුරෙන් අවසාදිත පාෂාණ වර්ගවලින් ලබාගත හැකි ප්‍රයෝජන පමණක් ඇතුළත් වරණය තෝරන්න.
A - කාර්මිකාර්මික කටයුතු සඳහා යොදා ගැනීම
B - ආභරණ සෑදීම සඳහා යොදා ගැනීම
C - බලශක්ති මූලාශ්‍රයක් වශයෙන් යොදා ගැනීම
D - මහා මාර්ග ඉදිකිරීමේදී භාවිත කිරීම
E - බැවුම් ප්‍රදේශ ආරක්ෂාවට යොදා ගැනීම
(1) A හා B (2) A හා C (3) B හා C (4) D හා E (..2..)

**34.** ලෝකයේ ප්‍රධාන මිනිරන් නිෂ්පාදකයා ලෙස සැලකෙන රට වන්නේ,
(1) මැඩගස්කරයයි.
(2) ඉන්දියාවයි.
(3) ශ්‍රී ලංකාවයි.
(4) ටැන්සානියාවයි.
(..2..)

**35.** ලෝකයේ රටවල් සංවර්ධන මට්ටම අනුව කාණ්ඩ හතරක් යටතේ වර්ග කොට ඇත. මෙම වර්ග කිරීම සඳහා භාවිත කළ දර්ශකය වූයේ,
(1) භෞතික ජීවන තත්ත්ව දර්ශකයයි (PQLI).
(2) මානුෂ දරිද්‍රතා දර්ශකයයි (HPI).
(3) මානුෂ පීඩක දර්ශකයයි (HSI).
(4) මානුෂ සංවර්ධන දර්ශකයයි (HDI).
(..4..)

**36.** ගෝලීය උෂ්ණත්වය වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස ධ්‍රැවීය අයිස් නිධි දිය වී මුහුදු මට්ටම ඉහළ යාම නිසා අනාගතයේදී වඩාත් තර්ජනයකට ලක් වේ යැයි සැලකෙන දූපත් සමූහය කුමක් ද?
(1) මාලදිවයින් (2) අන්දමන් (3) ලක්ෂද්වීප (4) හවායි (..1...)

**37.** CFC වායු විමෝචන ක්‍රියාකාරකම් අවම කිරීම හා වසර 2000න් පසු මුළුමනින්ම ඉවත් කිරීම සහ වාහනවලින් බැහැර කෙරෙන දුම් පිළිබඳ පරීක්ෂාව පිළිබඳ තීරණ ගනු ලැබුයේ,
(1) 1972 ස්ටොක්හෝම් සමුළුව මගිනි.
(2) 1982 වියානා සම්මුතිය මගිනි.
(3) 1984 මොන්ට්‍රියල් කෙටුම්පත මගිනි.
(4) 1992 රියෝද්ජැනීරෝහි පැවැත්වූ 'මිහිකත' සමුළුව මගිනි.
(..4..)

- පහත A, B, C හා D වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක **38** සිට **40** තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. වියපත් ජන සංඛ්‍යාව
2. ශ්‍රම බලකාය

B - 1. කාර්මීකරණය
2. පාරිසරික විසංතුලනය

C - 1. පුනර්ජනනීය බලශක්ති
2. පාරිසරික තුලිතතාව

D - 1. සම්පත් භාවිතය
2. තිරසර සංවර්ධනය

**38.** පළමුවැන්නේ වැඩිවීම දෙවැන්නට හේතුවක් වන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (..2..)

**39.** දෙවැන්නේ ස්ථාවරය කෙරෙහි පළමුවැන්න බලපාන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (..3..)

**40.** දෙවැන්නේ අඩුවීම කෙරෙහි පළමුවැන්නේ වැඩිවීම හේතුවන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (..1...)

* *

/පස්වැනි පිටුව බලන්න.

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**/இலங்கைப் பரீட்சைத் திணைக்களம்/**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021 (2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021 (2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021 (2022)

විභාග අංකය
சுட்டெண்
**Index Number** ..............................

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි.
பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும்
For Examiner's Use Only

(61) භූගෝල විද්‍යාව II
புவியியல் II
**Geography** II

1. (අ) /(அ) /(a)

(i) අවතල බෑවුම — /

(ii) වනාන්තර — /

(iii) ජල කපොල්ල — /

(iv) ඊසාන — /

(v) පුළුල් ද්වීපය — /

(vi) රබර් — /

(vii) කි.මී. 4 — /

(viii) පාසල / තැපැල් කාර්යාලය / — /
උසාවිය / රෝහල — /
} මේවායින් දෙකක් නම් කිරීම

(ix) ගංගාව / ගඟ — /

10/10

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව දක්වා ඇති තීරුව (පිටු අංක **9**) යොදා ගන්න.

අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබදව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.

(i) **අරාබි සාගරය** - Ⓠ, Ⓡ, Ⓢ

(ii) **යුකටාන් අර්ධද්වීපය** - Ⓘ, Ⓙ, Ⓚ

(iii) **කොංගෝ ගංගාව** - Ⓤ, Ⓥ, Ⓦ

(iv) **බෙයිජිං නගරය** - Ⓐ, Ⓑ, Ⓒ

(v) **නවසීලන්තය** - Ⓛ, Ⓜ, Ⓝ

(ලකුණු 05 යි)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබදව දක්වා ඇති තීරුව (පිටු අංක **9**) යොදා ගන්න.

අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබදව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.

(i) **පේදුරුතුඩුව** - Ⓐ, Ⓑ, Ⓒ

(ii) **වෙරළ දඹයක්** පිහිටි ස්ථානය - Ⓞ, Ⓟ, Ⓠ

(iii) **කුමන** කුරුලු අභය භූමිය - Ⓤ, Ⓥ, Ⓦ

(iv) මිනිරන් ඛනිජය නිධිගතව ඇති **කහටගහ** සහ **කොළොන්ගහ** පතල් පිහිටි ස්ථානය - Ⓖ, Ⓗ, Ⓘ

(v) මෑතකදී ආරම්භ කරන ලද '**තම්බපවනි**' සුළං බලාගාරය පිහිටි දූපත - Ⓓ, Ⓔ, Ⓕ (ලකුණු 05 යි)


(ආ) /(ஆ) /(b)




| | |
|---|---|
| (i) | S |
| (ii) | I |
| (iii) | V |
| (iv) | A |
| (v) | M |
| | 5/5 |

2.

(ඉ) /(இ) /(c)




| | |
|---|---|
| (i) | C |
| (ii) | O |
| (iii) | V |
| (iv) | I |
| (v) | D |
| | 5/5 |

1. (අ) (அ) (a) $\frac{10}{10}$ (ආ) (ஆ) (b) $\frac{5}{5}$ (ඉ) (இ) (c) $\frac{5}{5} = \frac{20}{20}$

- ඉහත දක්වා ඇති තර්ජන විස්තර කිරීමේදී පහත දක්වා ඇති මානුෂ ක්‍රියාකාරකම් අදාල කර ගත හැකිය.
  - ➢ වනාන්තර එළි කිරීම
  - ➢ වනාන්තර ගිනි තැබීම
  - ➢ අනවසර දැව ජාවාරම්
  - ➢ පරිසරයට කැලි කසල මුදා හැරීම
  - ➢ කම්හල්වලින් අවිධිමත් ලෙස අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීම
  - ➢ රසායනික පොහොර, කෘමි නාශක, වල් නාශක වැනි කෘෂි රසායනික අවිධිමත් ලෙස භාවිතය
  - ➢ අක්‍රමවත් භූමි පරිහරණය

මෙවැනි මානුෂ ක්‍රියාකරකම් ඇසුරින් ජෛව ගෝලයේ පැවැත්මට එල්ල වී ඇති තර්ජන පිළිබඳ විස්තර කිරීම

**(iii) තර්ජන තුන නම් කිරීමට ලකුණු** 03
**එකක් පිළිබඳ විස්තර කිරීමට ලකුණු** 02
05

**ඉගෙනුම් පල :**

3.

- ආසියාවෙන් බැහැර වී වගා කරන ප්‍රදේශ නම් කරයි.
- ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි වී වගාව වැදගත් වීමට හේතු දක්වයි.
- ශ්‍රී ලංකාවේ වී වගාව සඳහා ජෛවීය පොහොර භාවිත කිරීමේ වාසි අවාසි හා ගැටළු විස්තර කරයි.

3. (i) ආසියාවෙන් බැහැර, වී වගා කරන පහත සඳහන් එක් එක් ගංගා නිම්නය පිහිටි රට කුමක්දැයි අනුපිළිවෙළින් ලියා දක්වන්න.
   (a) පෝ ගංගා නිම්නය
   (b) මරේ-ඩාර්ලිං ගංගා නිම්නය (ලකුණු 02 යි)
   (ii) ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි වී වගාව වැදගත් වීමට බලපා ඇති හේතු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   (iii) (a) ශ්‍රී ලංකාවේ වී වගාව සඳහා ජෛවීය පොහොර භාවිත කිරීමේ වාසි **දෙකක්** සඳහන් කරන්න.
   (b) වී වගාව සඳහා ජෛවීය පොහොර භාවිත කිරීමේදී මතුවන ගැටලුවක් සඳහන් කොට එය විසඳා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(03)

I. (a) පෝ ගංගා නිම්නය : ඉතාලිය

(b) මරේ ඩාර්ලිං ගංගා නිම්නය : ඕස්ට්‍රේලියාව

**(i) ලකුණු (a) 1 (b) 1 = 02**

II.

- ලාංකිකයන්ගේ ප්‍රධාන ආහාරය වීම
- දේශීය වෙළඳ භෝගයක් ලෙස වැදගත් වීම
- සහල් ආශ්‍රිත අතුරු නිෂ්පාදන රාශියක් වෙළෙඳපොළට ඉදිරිපත් කළ හැකි වීම (විවිධ ආහාර වර්ග, විවිධ සත්ත්ව නිෂ්පාදන යනාදිය)
- කර්මාන්ත රැසකට අමුද්‍රව්‍ය සැපයීමට හැකිවීම
- පොහොර නිපදවීමට හැකි වීම (පිදුරු/ දහයියා)

- විවිධ රැකියා අවස්ථා බිහි වීම
- විදේශ විනිමය ඉතිරි කර ගත හැකි වීම
- විදේශ විනිමය උපයා ගැනීමේ හැකියාව
- ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම වගා කළ හැකි වීම

**මෙවැනි කරුණු තුනක් සඳහන් කිරීමට**
**(ii) ලකුණු 1 x 3 = 03**

III. (a) වී වගාව සඳහා පොහොර භාවිතා කිරීමේ වාසි

- පසෙහි ගුණාත්මකභාවය ආරක්ෂා වීම
- ජල මූලාශ්‍ර හා පස දූෂණය වීම අවම වීම
- දේශීය වශයෙන් සෑම ගොවියෙකුටම නිපදවා ගත හැකි වීම
- රසායනික පොහොර ආනයනය සඳහා වැයවන මුදල් ඉතිරි කර ගත හැකි වීම
- පරිසර හිතකාමී වීම
- පාංශු ඛාදනය අවම වීම
- කෘමිනාශක භාවිතය අවම කර ගත හැකි වීම
- රසයෙන් හා පෝෂ්‍යදායකත්වයෙන් යුතු සහල් නිෂ්පාදනය කර ගැනීමේ හැකියාව
- ජනතාවගේ සෞඛ්‍ය ගැටලු අවම කර ගත හැකි වීම

(මෙවැනි වාසි දෙකක් සඳහන් කිරීම)

(b) ඓන්ද්‍රිය පොහොර භාවිතා කිරීමේ දී මතුවන ගැටලු

- නියම ප්‍රමිතියෙන් යුතු පොහොර නිපදවා ගැනීමේ ගැටලුව
- ඓන්ද්‍රිය පොහොර නිපදවීම පිළිබඳව ගොවීන්ගේ දැනුම අල්ප වීම
- පොහොර නිපදවීම සඳහා කම්කරු ශ්‍රමය බහුලව අවශ්‍ය වීම
- පොහොර නිපදවීමට වැඩි කාලයක් ගත වීම
- වගාව සඳහා ඓන්ද්‍රිය පොහොර විශාල ප්‍රමාණයක් යෙදවිය යුතුවීම
- ඓන්ද්‍රිය පොහොර භාවිතය නිසා පැල වැඩීම සෙමින් සිදුවීම
- රසායනික පොහොර භාවිතයෙන් ලැබෙන අස්වැන්නට වඩා ඓන්ද්‍රිය පොහොර භාවිතයෙන් ලැබෙන අස්වැන්න අඩුවීමේ හැකියාව
- පොහොර නිපදවීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය සොයා ගැනීමේ අපහසුව
- ආනයනික ඓන්ද්‍රිය පොහොර භාවිතයෙන් ජෛව පද්ධතියට අහිතකර බලපෑම් එල්ල විය හැකිවීම

(මෙවැනි ගැටලුවක් සඳහන් කිරීම)

➢ ගැටලු නිරාකරණය සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග

- පොහොර නිෂ්පාදනය සඳහා රාජ්‍ය මැදිහත් වීම
- නියම ප්‍රමිතියෙන් යුතු පොහොර නිපදවීම සඳහා ගොවීන්ට පුහුණුවක් දීම
- පොහොර නිෂ්පාදනය පිළිබඳ උපදේශන සේවා ආරම්භ කිරීම
- පොහොර නිෂ්පාදනය සඳහා ගොවීන්ට ණය හා සහනාධාර සැපයීම
- පොහොර නිෂ්පාදනය සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීම
- අස්වනු අඩුවීමේ පාඩුව පිරිමසා ගැනීම සඳහා ගොවීන්ට වන්දි හා සහනාධාර ලබා දීමේ වැඩපිළිවෙලක් ආරම්භ කිරීම

(මෙවැනි ක්‍රියාමාර්ගයක් විස්තර කිරීම)

**(iii) (a) වාසි දෙකකට ලකුණු 02**
**(b) ගැටලුව නම් කිරීමට ලකුණු 01**
**නිරාකරණ ක්‍රියාමාර්ග විස්තරයට ලකුණු 02**

**ඉගෙනුම් පල :**


4.
- ශ්‍රී ලංකාවේ ආකෘති සිතියමක ධීවර වරායන් හා මිරිදිය මසුන් බෝ කරන මධ්‍යස්ථාන පිහිටි ස්ථාන නම් කරයි.
- ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි ධීවර කර්මාන්තයේ ඇති වැදගත්කම විස්තර කරයි.
- සාගර ජලය දූෂණය වන ආකාර නම් කරයි
- සාගර ජලය දූෂණය වීම ධීවර කර්මාන්තයට අහිතකර ලෙස බලපාන ආකාරය විස්තර කරයි.

4. (i) යාබදව දක්වා ඇති ශ්‍රී ලංකාවේ සිතියම් කොටසෙහි Ⓐ අක්ෂරයෙන් දක්වා ඇති ධීවර වරායෙහි නම ද Ⓑ අක්ෂරයෙන් දක්වා ඇති මිරිදිය මසුන් බෝකරන මධ්‍යස්ථානයෙහි නම ද අනුපිළිවෙළින් ලියන්න. (ලකුණු 02 යි)

(ii) ධීවර කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි වැදගත් වීමට හේතු **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) (a) සාගර ජලය දූෂණය වන ආකාර **දෙකක්** සඳහන් කරන්න.

(b) සාගර ජලය දූෂණය වීම ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයට අහිතකර ලෙස බලපාන ආකාරය කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)




(04)

I. (a) ධීවර වරාය - දෙවුන්දර /දෙමුන්දර කළපුව

(b) මිරිදිය මසුන් බෝකරන මධ්‍යස්ථානය - ඉඟිනියාගල

**(i) ලකුණු 1 + 1 = 02**

II.
- ජනතාවගේ ආහාරය සඳහා අවශ්‍ය ප්‍රෝටීන් ලබා ගැනීමට හැකි වීම
- ධීවර නිෂ්පාදන සඳහා දේශීය හා විදේශීය වෙළෙඳපොලක් තිබීම
- රැකියා අවස්ථා උදාකර ගත හැකිවීම (ඍජු හා වක්‍ර රැකියා) රැකියා නම් කිරීමට ලකුණු දෙන්න.
- ධීවර කර්මාන්තයේ දියුණුව සඳහා අවශ්‍ය විභව සම්පත් පැවතීම
- මත්ස්‍ය ආනයන සඳහා වැයවන මුදල් ඉතිරිකර ගත හැකි වීම

**(මෙවැනි කරුණු තුනක් නම් කිරීමට (ii) ලකුණු 1 x 3 = 03)**

III. (a) සාගර ජලය දූෂණය වන ආකාර
- සාගරයට ඛනිජ තෙල් මිශ්‍ර වීම (නැව් මගින් මුදා හරින දැවි තෙල්, තෙල් කාන්දු වීම, තෙල් නැ... විනාශ වීම)
- ප්ලාස්ටික් හා වෙනත් ඝන අපද්‍රව්‍ය මුහුදට එකතු කිරීම (වෙරළාශ්‍රිත කම්හල්වලින්, සංචාරකයි... මගින්, ප්ලාස්ටික් අපද්‍රව්‍ය වෙරළ කලාපයේ මුදා හැරීම)
- ධීවර කර්මාන්තයේ නියැලෙන්නන් විසින් ඉවත දමන අපද්‍රව්‍ය (නයිලෝන් දැල්, ප්ලාස්ටික් ම... ප්ලාස්ටික් කෑන් සාගරයට බැහැර කිරීම)
- වගාබිම්වලින් මුදා හැරෙන රසායනික පොහොර, කෘමිනාශක හා වල්නාශක ගංගා මඟි... වෙරළාසන්න මුහුදු ජලයට මිශ්‍ර වීම
- සාගරය ආශ්‍රිතව කෙරෙන න්‍යෂ්ටික අත්හදා බැලීම්

**(මෙවැනි ආකාර දෙකක් සඳහන් කිරීම ලකුණු 1 x 2 = 0...**

(b)

- මත්ස්‍ය විශේෂ වඳවී යාමේ තර්ජනයක් ඇති වීම
- අහිතකර ඇල්ගී වර්ග හා ජලජ පැලෑටි බෝ වීම නිසා මත්ස්‍ය ආහාර වර්ධනය අඩපණ වීම
- අපවිත්‍ර ජලයේ වැඩෙන මසුන් ආහාරයට ගැනීමෙන් රෝගාබාධවලට ලක්වීමේ අවදානම නිසා පාරිභෝගිකයන් මසුන් මිලදී ගැනීමට අකමැති වීමෙන් මත්ස්‍ය අලෙවිය පිළිබඳ ගැටලු පැන නැගීම
- ධීවර ආම්පන්නවලට හානි සිදුවීම

* ධීවරයන්ට රැකියා අවස්ථා අඩු වීම **(මෙවැනි කරුණු දෙකක් ඇසුරින් විස්තර කිරීමට ලකුණු 03)**

**(iii) (a) 2 (b) 3 = <u>05</u>**

**ඉගෙනුම් පල :**

**5.**

- මෝටර් රථ කර්මාන්තයට වැදගත්වන ආසියාතික රටවල් නම් කරයි.
- මෝටර් රථ කර්මාන්තයේ නව ප්‍රවණතා සඳහන් කරයි.
- ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය වර්තමානයේ මුහුණපාන ගැටළු විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණපාන ගැටලු නිරාකරණය කර ගැනීමේ ක්‍රියාමාර්ග පැහැදිලි කරයි.

**5.** (i) මෝටර් රථ කර්මාන්තය සඳහා වැදගත් වන ආසියාතික රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) මෝටර් රථ කර්මාන්තයේ නව ප්‍රවණතා **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය වර්තමානයේ මුහුණ පා ඇති ගැටලු **තුනක්** සඳහන් කර ඉන් එක් ගැටලුවක් නිරාකරණය කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(05)

I.

- ජපානය
- චීනය
- ඉන්දියාව
- දකුණු කොරියාව
- මැලේසියාව
- තායිලන්තය

**මෙවායින් රටවල් දෙකක් නම් කිරීමට (i) ලකුණු 1 + 1 = 02**

II. • මෝටර් රථ කර්මාන්තයේ නව ප්‍රවනතා

- ➢ නවීන තාක්ෂණික ශිල්පක්‍රම සහිත යාන්ත්‍රික ශ්‍රමය උපරිම ලෙස යොදා ගැනීම
- ➢ විවිධ රටවල් ඒකාබද්ධව නිෂ්පාදන එළි දැක්වීම
- ➢ අධි සුඛෝපභෝගී රථවාහන නිෂ්පාදනය කිරීම
- ➢ ප්‍රවාහනය කරන ද්‍රව්‍ය අනුව සුවිශේෂී නිෂ්පාදන නිර්මාණය කිරීම
- ➢ ගොඩ, මඩ, දිය පොදුවේ ධාවනය කළ හැකි නිෂ්පාදන එළි දැක්වීම
- ➢ ගුවනින් යා හැකි මෙන්ම ජලයේ කිමිදී යාහැකි මෝටර් රථ නිපදවීම
- ➢ ලාභදායී ශ්‍රමය, අමුද්‍රව්‍ය ගෙන්වා ගැනීමේ පහසුව, විදේශ වෙළෙඳපොල වැනි සාධක මත ආසියාතික රටවල් බොහොමයක මෝටර් රථ කර්මාන්තය සීඝ්‍රයෙන් දියුණු වීම

- ➢ අතීතයේ මෝටර් රථ නිෂ්පාදනය නොකළ ඇතැම් රටවල් මෝටර් රථ නිෂ්පාදනයට දායක වෙමින් සිටීම
- ➢ සුවිශේෂී විද්‍යුත් උපාංග හා උපකරණ සහිත මෝටර් රථ නිපදවීම
- ➢ විදුලි බලයෙන් ක්‍රියා කරන මෝටර් රථ නිෂ්පාදනය සීඝ්‍රයෙන් වැඩිවෙමින් පැවතීම
- ➢ ඉන්ධන අරපිරිමැස්ම සඳහා ප්‍රමාණයෙන් කුඩා වාහන නිපදවීමට වැඩි අවධානය
- ➢ පරිසර හිතකාමී වාහන නිෂ්පාදනය
- ➢ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා විශේෂ වාහන නිපදවීම
- ➢ මගී ආරක්ෂා සුරක්ෂිත කිරීම

**මෙවැනි ප්‍රවණතා තුනක් සඳහන් කිරීමට (ii) ලකුණු 1 x 3 = 03**

6

III. • ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය වර්තමානයේ මුහුණපාන ගැටලු

- ➢ ධනවත් සංචාරකයන්ගේ පැමිණීම සීමා වීම
- ➢ සංචාරකයන් වැඩි සංඛ්‍යාවක් පැමිණීම වර්ෂයේ එක් කාලයකට පමණක් සීමා වීම
- ➢ සංචාරකයන් මෙරට ගත කරන කාල සීමාව කෙටි වීම
- ➢ සංචාරකයන්ට සපයන සේවාවන්හි ගුණාත්මක බව සෑම සංචාරක ප්‍රදේශයකම එකහා සමානව පවත්වා ගෙන යාමට ඇති දුෂ්කරතාව
- ➢ ප්‍රමාණවත් ලෙස යටිතල පහසුකම් සංවර්ධනය නොවීම
- ➢ සංචාරක කර්මාන්තය මගින් සමාජ සංස්කෘතික පරිසරයට සිදුවන බලපෑම
- ➢ ස්වාභාවික පරිසරයට සිදුවන බලපෑම
- ➢ වසංගත රෝග ව්‍යාප්ත වීම
- ➢ රට තුළ පවතින දේශපාලන, සමාජ හා ආර්ථික අස්ථාවර බව

**(මෙවැනි ගැටලු තුනක් සඳහන් කිරීමට ලකුණු 03)**

• ගැටලු නිරාකරණයට ගත හැකි ක්‍රියා මාර්ග

- ➢ යටිතල පහසුකම් වර්ධනය කිරීම
- ➢ ප්‍රවාහන සේවා වැඩි දියුණු කිරීම
- ➢ සංචාරක ආකර්ෂණය වර්ධනය කිරීම
- ➢ සංචාරක හා ආගන්තුක සේවා කටයුතු සඳහා අවශ්‍ය විශේෂ පුහුණු ශ්‍රමිකයන් බිහි කිරීම සඳහා ආයතන පිහිටුවීම
- ➢ ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ෂණ පිළිබඳව විදේශ රටවල් දැනුවත් කිරීමේ වැඩ පිළිවෙලවල් සංවිධානය කිරීම
- ➢ සංචාරක කර්මාන්තයේ දියුණුව සඳහා පෞද්ගලික ආයෝජකයන්ගේ අනුග්‍රහය ලබා ගැනීම

මෙවැනි එක් ක්‍රියාමාර්ගයක් විස්තර කිරීම

**(iii) ගැටලු තුන නම් කිරීම ලකුණු 03**

**නිරාකරණය සඳහා ක්‍රියාමාර්ගයට ලකුණු 02**

05

**ඉගෙනුම් පල :**

6.

- ලෝකයේ ප්‍රධාන වනාන්තර වර්ග කර නම් කරයි.
- වනාන්තර හා වන ජීවීන් මුහුණපාන ගැටලු නම් කරයි.
- ශ්‍රී ලංකාවේ වනාන්තර සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියා මාර්ග යෝජනා කරයි.

6. (i) ලෝකයේ ව්‍යාප්ත වී ඇති ප්‍රධාන වනාන්තර වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) වර්තමානයේ වනාන්තර හා වන ජීවීන් මුහුණ පා ඇති ගැටලු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ වනාන්තර සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** යෝජනා කර ඉන් එක් ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක කිරීම සඳහා ඔබට සහාය විය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

I.

- නිවර්තන වර්ෂා වනාන්තර
- සෞම්‍ය කලාපික වනාන්තර
- කේතුධර වනාන්තර

**මින් දෙකක් නම් කිරීමට (i) ලකුණු 1 + 1 = 02**

II. වර්තමානයේ වනාන්තර හා වනජීවීන් මුහුණ පා ඇති ගැටලු

- මිනිස් කටයුතු සඳහා වනාන්තර එළි කිරීම නිසා වනාන්තර ව්‍යාප්තියට තර්ජන ඇති වීම
- වන ජීවීන්ට තර්ජන ඇතිවීම (සංචරණයට බාධා, ආහාර හිඟ වීම, වාසස්ථාන අහිමි වීම)
- විවිධ මිනිස් අවශ්‍යතා සඳහා වන ජීවීන් දඩයම් කිරීම
- ලෙඩ රෝග හා වසංගතවලට වන ජීවීන් ගොදුරු වීම
- ආක්‍රමණශීලී ශාක හා සත්ත්ව විශේෂ බෝවීම
- රසායනික ද්‍රව්‍ය භාවිතය නිසා ශාක හා සත්ත්ව ප්‍රජාවේ පැවැත්මට තර්ජන ඇතිවීම
- දේශගුණ විපර්යාස හා විවිධ මානුෂ ක්‍රියාකාරකම් නිසා (නියඟ, ලැව්ගිනි හා ගිනි තැබීම) වනාන්තර හා වන ජීවීන් විනාශ වීම
- පරිසර දූෂණය නිසා ශාක හා සත්ත්ව විශේෂ විනාශ වීම
- වාණිජමය අරමුණු සඳහා සත්ත්ව හා ශාක විශේෂ එකතු කිරීම නිසා ඒවා වඳවීම

**මෙවැනි ගැටලු තුනක් නම් කිරීමට ලකුණු 1 x 3 = 03**

III. ශ්‍රී ලංකාවේ වනාන්තර සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියා මාර්ග

- ජාතික රක්ෂිත හා අභය භූමි පවත්වා ගෙන යාම
- වන වගා ව්‍යාපෘති ආරම්භ කිරීම
- වන සංරක්ෂණ උපාය මාර්ග අනුගමනය කිරීම (Sloping Agricultural Land Technology)
- කඩොලාන බිම් රැක ගැනීමට කටයුතු කිරීම, තෙත්බිම් ආරක්ෂා කිරීම)
- වන විනාශයේ අහිතකර ප්‍රතිඵල පිළිබඳව ජනතාව දැනුවත් කිරීම
- වන සම්පත් ආරක්ෂා කිරීම සඳහා පවතින නීති රීති බල ගැන්වීම
- නැවත වන වගාව

(මෙවැනි ක්‍රියාමාර්ග තුනක් නම් කිරීම)

එක් ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක කිරීම සඳහා සහභාගී විය හැකි ආකාරය විස්තර කිරීමට

**(iii) වන සංරක්ෂණ ක්‍රියාමාර්ග තුන නම් කිරීම ලකුණු 03**

**සහභාගී විය හැකි ආකාරය විස්තරයට ලකුණු 02**

05

**ඉගෙනුම් පල :**

**7.**

- ලෝක ආකෘති සිතියමක ජනාධික කලාප හා ජන හීන කලාප නම් කර දක්වයි.
- සංවර්ධනය වෙමින් පවතින රටවල සීඝ්‍ර ජන සංඛ්‍යා වර්ධනය නිසා උද්ගත වී ඇති ගැටලු හඳුනාගෙන නම් කරයි.
- ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව සම්බන්ධයෙන් මෑත කාලීනව දැකිය හැකි විශේෂ ලක්ෂණ ශ්‍රී ලංකාවේ සංවර්ධනය කෙරෙහි බලපාන ආකාරය විස්තර කරයි.

7. (i) යාබදව දක්වා ඇති සිතියම් කොටසෙහි Ⓐ අක්ෂරයෙන් දක්වා ඇති ජනාධික කලාපයෙහි නම ද, Ⓑ අක්ෂරයෙන් දක්වා ඇති ජනහීන කලාපයෙහි නම ද අනුපිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල ශීඝ්‍ර ජන සංඛ්‍යා වර්ධනය නිසා වර්තමානයේ උද්ගත වී ඇති ගැටලු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව සම්බන්ධයෙන් මෑත කාලීනව දැකිය හැකි කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** සඳහන් කර, ඉන් එක් ලක්ෂණයක් තෝරා ගෙන එය ශ්‍රී ලංකාවේ සංවර්ධනය කෙරෙහි බලපාන ආකාරය විස්තර කරන්න. (ලකුණු 05 යි)




I. (A) වයඹ දිග යුරෝපය
(B) සහරා කාන්තාරය

**(i) ලකුණු 1 + 1 = 02**

II.
- විරැකියාව වර්ධනය වීම
- ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා විශාල වියදමක් දැරීමට සිදුවීම
- ඒක පුද්ගල ආදායම පහත වැටීම
- සුබ සාධක වියදම් අධික වීම
- ඒක පුද්ගල භූමි ප්‍රමාණය අඩුවීම
- ඉඩම් කැබලි වීම
- වනාන්තර එළි කිරීම නිසා වන විනාශය
- සම්පත් හිඟය
- නිවාස හිඟය
- මුඩුක්කු පැල්පත් නිවාස බිහි වීම
- කැලි කසළ එකතුවීම
- පරිසර දූෂණය
- වසංගත රෝග පැතිර යාම
- පිරිසිදු පානීය ජලය හිඟ වීම

**(ii) මෙවැනි ගැටලු තුනක් සඳහන් කිරීමට ලකුණු 1 x 3 = 03**

III.

- ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව සම්බන්ධයෙන් මෑත කාලීනව දැකිය හැකි කැපී පෙනෙන ලක්ෂණ :
  - ➢ බාල වයස් සංඛ්‍යාවේ අඩුවීමක් දක්නට ලැබීම
  - ➢ වැඩිහිටි ජන සංඛ්‍යාවේ වර්ධනයක් දක්නට ලැබීම
  - ➢ ස්ත්‍රීන්ගේ ප්‍රතිශතය වැඩිවෙමින් පැවතීම

    මෙවැනි ලක්ෂණ තුනක් නම් කිරීම

  * ජන සංඛ්‍යාවේ වාර්ෂික වර්ධනය සෙමෙන් මන්දගාමී වීම
- ශ්‍රී ලංකාවේ සංවර්ධනය කෙරෙහි ඇති කරන බලපෑම
  - ➢ බාල වයස් යැපෙන්නන්ගේ සංඛ්‍යාව අඩුවීම නිසා අනාගතයේ දී ශ්‍රම බලකායට ඇති කරන බලපෑම
  - ➢ වැඩිහිටි ජන සංඛ්‍යාවේ වර්ධනය නිසා ඔවුන්ගේ සුබ සාධනය සඳහා වැඩි වියදමක් දැරීමට සිදුවීම

    (මෙවැනි කරුණක් ශ්‍රී ලංකාවේ සංවර්ධනයට බලපාන ආකාරය විස්තර කිරීම)

**(iii) ජන සංඛ්‍යාවේ කැපී පෙනෙන ලක්ෂණ තුනට ලකුණු** 03
**සංවර්ධනයට බලපාන ආකාරය විස්තර කිරීමට** 02
05

**ඉගෙනුම් පල :**

- ලෝකයේ උපද්‍රව වර්ග කර දක්වයි.
- ශ්‍රී ලංකාවේ ජල ගැලීම්වලට නිරතුරුවම ගොදුරු වන ගංගා නිම්න නම් කරයි.
- ශ්‍රී ලංකාවේ ජල ගැලීම් ආපදාව අවම කිරීමට ගත හැකි ක්‍රියා මාර්ග පැහැදිලි කරයි.

**8.** (i) පහත දක්වා ඇති එක් එක් උපද්‍රව වර්ගයට නිදසුනක් බැගින් සපයන්න.
(a) ජීව විද්‍යාත්මක උපද්‍රව
(b) භූ විද්‍යාත්මක උපද්‍රව (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ ජල ගැලීම්වලට නිරතුරුවම ගොදුරු වන ප්‍රධාන ගංගා නිම්න **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ ජල ගැලීම් ආපදාව අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කොට ඉන් **එක්** ක්‍රියාමාර්ගයක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

I. (a)

- වසංගත රෝග
- ලැව් ගිනි
- ශාක හෝ සත්ත්වයින් මහා පරිමාණ ලෙස වඳවීම

**මින් එකක් නම් කිරීම**

(b)

- භූමි කම්පා
- සුනාමි
- ගිනි කඳු පිපිරීම
- නාය යෑම

**මින් එකක් නම් කිරීම**

**(i) (a) 1 + (b) 1 = ලකුණු 02**

II.

- කළු ගඟ
- කැලණි ගඟ
- ගිං ගඟ
- නිල්වලා ගඟ
- මහ ඔය
- මහවැලි ගඟ

**මෙවායින් ගංගා නිම්න තුනක් නම් කිරීම**

**(ii) 1 x 3 = 03**

III. ශ්‍රී ලංකාවේ ජල ගැලීම් ආපදාව අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග

- ගංගා පෝෂක ප්‍රදේශවල වනාන්තර ආරක්ෂා කිරීම
- ගංගාවල මෝය විවෘතව තබා ගැනීම
- පහත්බිම හා තෙත් බිම් ආරක්ෂා කිරීම
- ගංගාවල වැලිගොඩ දැමීම සීමා කිරීම
- ජල ගැලීම්වලට ඔරොත්තු දෙන ඉදිකිරීම්වලට යොමු වීම
- පිටාර ගැලීම් සිදුවන ස්ථානවල මානව කටයුතු සීමා කිරීම
- ආරක්ෂිත ක්‍රියාමාර්ග ගැනීම
- ජනතාව දැනුවත් කිරීම

**(iii) ක්‍රියාමාර්ග තුන නම් කිරීමට ලකුණු 03**
**එක් ක්‍රියාමාර්ගයක් පැහැදිලි කිරීමට ලකුණු 02**
**05**